Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

3

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-01-07 |
|---|---|---|

පැමිණිලිකරු : ඩබ්ලිව්.එස්.ටී. පෙරේරා මිය,
නො. 218/ඒ, කේ.සෝමරත්න පෙරේරා මාවත,
වැවිට.

වගඋත්තරකරුවන් : 01. ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂක (ජාතික පාසල්)
ජාතික පාසල් අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. විදුහල්පති
ශ්‍රී සුමංගල විද්‍යාලය,
පානදුර.

<u>පැමිණිලි අංක : **HRC/2497/15**</u>

ඉහත අංකය යටතේ ගොනු කරන ලද පෙත්සමට අදාළව පරීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිදු කළ පසු පෙත්සමේ සඳහන් සියළු කරුණු ද වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම් ද පරීක්ෂණ අවස්ථාවලදී ඉදිරිපත් කළ කරුණු ද සලකා බලා පහත සඳහන් අවසන් නිර්දේශය ඉදිරිපත් කරමින් ඒ අනුව පියවර ගන්නා ලෙස වගඋත්තරකරුවන්ට මින් දන්වා සිටිනු ලැබේ.

**පෙත්සමේ සඳහන් කරුණු :-**

පෙත්සම්කාරියගේ දරුවා වන එච්.ජේ.ඩී.ඉෂේන් සාශෙන්ක පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේ පිරිමි පාසලේ 2015 වසරට 2 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා පෙත්සම්කාරිය විසින් ඉල්ලීමක් සිදු කර අයදුම්පතක් ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳ සලකා බලා විදුහල්පති විසින් අදාළ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සලකා බලා අනුමැතිය ලබා දී නොමැති බවද, පසුව අභියාචනා කමිටුව වෙත අයදුම්පත් ඉදිරිපත් කළ බවද, නමුත් සම්මුඛ පරීක්ෂණයකට හෝ කැඳවා කරුණු විමසීමකින් තොරව වගඋත්තරකරුවන් විසින් තම දරුවාට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවද, ඉන් පෙත්සම්කාරියගේ අයිතිවාසිකම්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කිංසි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 2694924 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி | 94 -11- 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர் | 2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 2689064 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

උල්ලංඝනය කර ඇති බවද අදාළ පාසලේ 2015 වසරේ 2 වන ශ්‍රේණියට තම දරුවාට ඇතුළත් වීමට ඇති අවස්ථාව අහිමි කර වගඋත්තරකරුවන් වෙනත් දරුවන් පාසලට ඇතුළත් කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් යටතේ දක්වා ඇති 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවද දක්වා තිබේ.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පෙත්සමට අදාළව වගඋත්තරකාර ශ්‍රී සුමංගල විද්‍යාලය විසින් එවා ඇති 2015.08.24 දිනැති වාර්තාවේ දක්වා ඇති පරිදි 2015 වර්ෂය සඳහා 2 වන ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් 32 ක් ලැබුණු බව ද ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලුදෙනාම 2015.02.25 වන දින සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පසු පවතින පුරප්පාඩු අනුව එක් ශ්‍රේණියක 45 සීමාව යටතේ සිසුන් ඇතුළත් කිරීමට ඇති හැකියාව සලකා බලා තෝරා ගත් ළමුන් පිළිබඳ ලේඛනය නිර්දේශ කොට 01 වන වගඋත්තරකරුට යවන ලද බවද දක්වා ඇත. නමුත් අමාත්‍යාංශය විසින් පවත්වන ලද අභියාචන පරීක්ෂණ කිරීමට අදාළ විශේෂ කමිටුවක් මගින් තෝරා ගන්නා ලද දරුවන් ඇතුළත් කිරීමට නම් කර තිබීම මත පෙත්සම්කාරියගේ දරුවා ඇතුළත් කිරීමට 01 වන වගඋත්තරකරු අනුමත නොකල බැවින් විදුහලේ අදාළ ශ්‍රේණියට දරුවා බඳවා ගැනීමට හැකියාවක් නොලැබුණු බවද දන්වා ඇත.

02 වන වගඋත්තරකරු විසින් යොමු කර ඇති වාර්තාවට අනුව දක්වා ඇත්තේ, 2015 වසරේ අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමේදී ප්‍රධාන වශයෙන් සලකා බලන ලද්දේ 2015.02.09 දිනැතිව ප්‍රධාන පුවත්පත් මගින් පළ කරන ලද දැන්වීමට අනුව කටයුතු කිරීම වන බවද, අමාත්‍යාංශයට යොමු කරන ලද අභියාචනා පමණක් සලකා බලන බවද බොහෝ පාතික පාසල් වල විදුහල්පතිවරුන් විසින් ඒවා තිබූ නිර්දේශිත නාම ලේඛන 2008/38 අංක දරණ චක්‍ර ලේඛනය එනම් අතරමැදි ශ්‍රේණි වලට සිසුන් බඳවා ගැනීමේ චක්‍රලේඛය ප්‍රකාරව සලකා බලා සකස් කර නොතිබීම මත මෙම පියවර ගැනීමට සිදු වී ඇති බවද වේ.

විදුහල්පති විසින් ඒවා තිබූ නාම ලේඛනයට අනුමැතිය ලබා නොදුන් බව ඉන් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

මෙම පැමිණිල්ලට අදාළව 2015.09.22 දින පැවැති මුල් පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ, 40 ක සීමාව අභිබවා සිසුන් ඇතුළත් කර ගෙන නොමැති බවත් පාසලට ඇතුළත්වීමට අනුමැතිය ලබා දී ඇති සිසුන් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ හෝ අධ්‍යයන කාර්ය මණ්ඩලවල සේවය කරන අයගේ දරුවන් ඇතුළත් කිරීමට දන්වා ඇති බවද වේ. මෙම කරුණු තහවුරු කර ගැනීමට 03 වන වගඋත්තරකාර විද්‍යාලයෙන් 2015 වසරේ 2 ශ්‍රේණියේ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් කැඳවා ඇත. එකී වාර්තාවේ කරුණු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 2A | - | 47 |
| 2B | - | 45 |
| 2C | - | 45 |

| | | |
|---|---|---|
| 2D | - | 44 |
| 2E | - | 44 |
| 2F | - | 44 |

ඉහත කරුණු අනුව වගඋත්තරකරුවන් දරුවන් බඳවා ගැනීමේ සීමාව 40 ක සීමාවට යටත්ව සිදුකර ඇති බව පෙන්වා දුන්නද, ඔවුන්ගේ වාර්තා අනුවම එය එසේ නොවන බවද තහවුරු වේ. එසේම 2015.10.16 දින පරීක්ෂණ අවස්ථාවේදී පහත කරුණු අනුව පහත සඳහන් කරුණු අනාවරණය වී ඇත.

අතරමැදි ශ්‍රේණි සඳහා ළමුන් බඳවා ගැනීමට පවතින චක්‍ර ලේඛය වන්නේ 2008/38 චක්‍රලේඛය පමණක් වන අතර වෙනත් නිතිමය ක්‍රමවේදයක් නොමැති බව අනාවරණය වේ. පාසලේ 2 ශ්‍රේණියේ පැවැති ඇබෑර්තු සලකා බලා 45 සීමාවට යටත්ව සිසුන් හත්දෙනෙකු ඇතුළත් කිරීමට ඇති හැකියාව පිළිබඳව දක්වා ලද අයදුම්පත් සලකා විදුහල්පති විසින් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගන්නා ලද ළමුන්ගේ නාම ලේඛනය එකී චක්‍රලේඛයට අනුව ඉදිරිපත් කළ පසු 01 වන වගඋත්තරකරු විසින් නිර්දේශ නොකළ බව 03 වන වගඋත්තරකරු විසින් දන්වා ඇත.

විශේෂ අභියාචනා කමිටුවක් මගින් විදුහල් වල ශ්‍රේණි වලට ළමුන් ඇතුළත් කිරීමට ඉදිරිපත් කළ අභියාචනා සලකා බලා ශ්‍රී සුමංගල විද්‍යාලයේ 02 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කල යුතු ආකාරයද 01 සහ 02 වගඋත්තරකරුවන් විසින් පෙන්වා දි තිබූ බව එහිදි දන්වා ඇත. ඒ අනුව කමිටුව පිහිටුවා ඇත්තේ අමාත්‍යාංශය වෙත ලැබෙන අභියාචනා සලකා බැලීමට බවද 2015.02.15 වන දින ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැන්වීමක් නිකුත් කර මාර්තු මස 06 වන දිනට පෙර අසාධාරණයට ලක් වු දරුවන්ගේ අභියාචනා සලකා බැලීමට ඉදිරිපත් වන ලෙස දක්වා තිබූ බවද පෙන්වා දුන් අතර පෙත්සම්කාරිය සඳහන් කර ඇත්තේ, සී 6 කමිටුව ලෙස නම් කරමින් විශේෂ අභියාචනා කමිටුවක් ඉහත පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඇති කර තිබීම මත එයට අයදුම්පතක් ඉදිරිපත් කරමින් තමා ද ඉල්ලීමක් සිදුකළ බවද ඒ අනුව තම අභියාචන ඉල්ලීම නොසලකා හැර පෙත්සම්කාරියගේ දරුවා තෝරා නොගත් බවද වේ.

එයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ මෙම පෙත්සම්කාරිය සහ ඇයගේ ස්වාමි පුරුෂයා වෛද්‍යවරුන් වුවද රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලැයිස්තුවේ ඔවුන්ගේ නම් සඳහන්වී නොතිබූ බැවින් එය තෝරා නොගැනීමට හේතුවක් වූ බවය. නමුත් එම සංගමයේ මෙම පෙත්සම්කාරිය සහ ඇයගේ ස්වාමි පුරුෂයා වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි වී ඇති බවද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් බවද දන්වා ඇති අතර, එකී සංගමයෙන් ලබාගත් ලිපියක් පවා අභියාචනා කමිටුවට යොමු කරන ලද බවත්, සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් විසින් කරන ලද අනුමැතිය සහිත ලිපියක්ද ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත. නමුත් ඒවා සලකා බලන ලද්දේද යන්න පිළිබඳ විමසා සිටිමේදි වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ ඒ පිළිබඳව ස්ථිර අදහසක් ඉදිරිපත් කළ නොහැකි බවයි.

විශේෂඥ වෛද්‍යවරුන් සඳහා වන අනිවාර්ය විදේශගත පුහුණුවීම් සඳහා ඔවුන් විදේශගතව සිටි බවද එකී පුහුණුවීම් නිම කර ශ්‍රී ලංකාවට පැමිණි පසු තම දෙවන දරුවා මෙම විද්‍යාලයට ඇතුළත් කිරීමට විදුහල්පතිගේ නිර්දේශය සහිතව අයදුම්පතක් ඉදිරිපත් කළ නමුත් දරුවා පාසලට තෝරා නොගැනීමෙන්

දැඩි අසාධාරණයක් වූ බව පැමිණිල්ලෙන් දක්වා ඇත. දරුවන් කිහිපදෙනෙකු පූරප්පාඩු රහිතව තිබියදී බඳවාගෙන ඇති බවද තම වැඩිමල් දරුවා මෙම විද්‍යාලයේ 6 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබමින් සිටි බව ද එම දරුවා සඳහා ද වසර 2 ක විදේශ නිවාඩු අනුමත කර ඇති බවද පැමිණිල්ලෙන් පෙන්වා දී ඇත.

2013 අප්‍රේල් මස ඔවුන් විදේශ ගත වනවිට තම දරුවන් දෙදෙනාද විදේශ ගත වූ බව වසර 2 ක විදේශ නිවාඩු කාලය අවසන් කර දෙවන දරුවාද තම වැඩිමහල් දරුවා අධ්‍යාපන ලබන පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලය වෙත ඇතුළත් කිරීමට ඉල්ලීමක් කළ පසු පාසැලේ පූරප්පාඩු පැවතිය ද ඒ සඳහා අවස්ථාවක් ලබානොදුන් බව කියාසිටින අතර, විශේෂ අභියාචනා කමිටුව වෙත කළ අභියාචනා ප්‍රතික්ෂේප කර ඇත්තේ නිසි සලකා බැලීමකින් තොරව බව කියා සිටී.

**නිරීක්ෂණ :-**

03 වන වගඋත්තරකාර ශ්‍රී සුමංගල විද්‍යාලයේ විදුහල්පති විසින් 2015 වසරේ 2 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමට අදාළව පවතින ඇබෑර්තු සලකා බලා ලද අයදුම්පත් 32 ක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසු අයදුම්කරුවන්ගේ දරුවන් හත්දෙනෙකුගේ නම් තෝරා ගෙන ඇත්තේ 2008/38 දරණ චක්‍ර ලේඛයට අනුව නිත්‍යානුකූලව බව තහවුරු වී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අභියාචනා කමිටුවක් පිහිටුවා අසාධාරණයට ලක් වූ අයදුම්කරුවන් සිටී නම් අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් සලකා බලන බවටද දක්වා ඇත්තේ පොදුවේ සමස්ථ පාසල් පද්ධතියම සඳහා පොදු නිවේදනයක් පරිදි බව අනාවරනය වේ.

පෙත්සම්කාරිය ඉහත කී විශේෂ අභියාචනා කමිටුවට අභියාචනයක් ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳව සලකා බලා පෙත්සම්කාරියට ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබාදී නොමැති අතර අදාළ අභියාචනා ඉදිරිපත් කළ වෙනත් අභියාචනා කරුවන්ගේ ඉල්ලීම් සලකා බලා අවශ්‍ය පියවර ගෙන ඇතත් මෙම පෙත්සම්කාරියට ඇහුන්කන් දීමේ අවස්ථාවක් ලබාදී නැති බව තහවුරු වී ඇත. රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයේ ලියාපදිංචි නාම ලේඛනයේ පෙත්සම්කාරියගේ නම නොතිබූ බවට දක්වා එකී අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබුණද, පෙත්සම්කාරිය ඉදිරිපත් කළ කරුණු අනුව හා ලේඛන අනුව අනාවරණය වන්නේ රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයේ පෙත්සම්කාරිය ලියාපදිංචි අයෙකු බව ද ඇයගේ ස්වාමි පුරුෂයා ද රජයේ වෛද්‍යවරුන්ගේ නාම ලේඛනයේ ලියාපදිංචිව සිටින බව ද වේ. ඒ බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ද සහතික කර ඇතත්, විශේෂ අභියාචනා කමිටුව ඒ පිළිබඳව සලකා බලා නැති අතර, එකී කරුණු සලකා නොබැලූ බවට ස්ථිර හේතු දැක්වීමට වගඋත්තරකරුවන් ද අපොහොසත් වී ඇත.

**නිගමනය :-**

01 සහ 02 වගඋත්තරකරුවන් විසින් විශේෂ අභියාචනා කමිටුවක් පත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ශ්‍රේණි වලට දරුවන් ඇතුළත් කිරීමට අයදුම් කළ පසු අසාධාරණයකට ලක් වූ අයදුම්කරුවන් සම්බන්ධව නැවත සොයා බලා කටයුතු කිරීමට පියවර ගන්නා බව පුවත්පත් දැන්වීමක් දක්වා තිබුණද පෙත්සම්කාරියගේ අයදුම්පත සම්බන්ධව සලකා බලා ඇති ආකාරය සාධාරණ එකක් නොවන බව අනාවරණය වේ. එයට හේතුව වන්නේ දෙපාර්ශවයට ඇහුන්කන් දියයුතුය යන සාධාරණ මූලධර්මයන්ට එරෙහිව කටයුතු කරමින්

පෙත්සම්කාරිය හට අභියාචනා කමිටුවට ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබා නොදී ඇති බැවිනි. රජයේ වෛද්‍යවරුන්ගේ නාම ලේඛනයේ පෙත්සම්කාරිය හා ඇයගේ ස්වාමි පුරුෂයා වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි වී තිබියදී ඒ පිළිබඳව නිසි සලකා බැලීමක් සිදුකිරීමකින් තොරව අභියාචනා කමිටුව කටයුතු කර ඇති බව අනාවරණය වේ.

එය 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන අතර, පෙත්සම්කාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී තිබීම වළක්වා ගැනීම සඳහා පෙත්සම්කාරියගේ දරුවා වන ඉෂේන් සාගෙන්ක 2015 වසරේ 2 ශ්‍රේණියට අදාළව බඳවා ගැනීම් ලේඛනයට ඇතුළත් කර අවශ්‍ය පියවර ගැනීමට හැකියාව තිබියදී එය නොසලකා හැර ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

**නිර්දේශය :-**

ඒ අනුව 2016 වසරේ 3 ශ්‍රේණියේ අධ්‍යාපන කටයුතු සඳහා පෙත්සම්කාරියගේ දරුවා ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගෙන කටයුතු කළ යුතු බවට වගඋත්තරකරුවන් වෙත මින් දන්වා සිටිමු.

2016.0 . දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

HUMAN RIGHTS COMMISSION
OF SRI LANKA
CHAIRMAN
COMMISSIONERS